# දියසුන්නත කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාරය

**එච්.එම්.ආර්.එස්.ඩී. බණ්ඩාර[1], පී.වී.ඩී.එන්. බන්ඩාර[2], ජේ.බී.එම්.එස්. කුමාරි[3]**

කෑගල්ල දිස්ත්‍රික්කයේ දියසුන්නත ග්‍රාමයේ පිහිටි කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාරය බුද්ධ ශාසන ඉතිහාසයේ සුවිශේෂ සන්ධිස්ථාන රාශියක් නියෝජනය කරන්නකි. මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන, ද්විතික මූලාශ්‍රය පරිහරණය ඇසුරෙන් දත්ත රැස්කරීම වේ. ක්‍රි.ව 1246 දී තුන් වැනි විජයබාහු රජු මෙහි තෙමහල් පිළිමගෙයක් නිර්මාණය කර අතර වර්තමානයේ ප්‍රතිසංස්කරණයට ලක්ව එක් මහලක් පමණක් දැකිය හැකිය. කුරුණෑගල රාජ්‍ය සමයේ දෙ වැනි බුවනෙකබාහු රජු ශිලාමය කොත්කැරැල්ලක් සහිත අඩක් අභ්‍යන්තර කොට ස්තූපයක් ගොඩනගා ඇති අතර ගම්පොළ රාජධානි සමයේ චිත්‍ර කලාවෙන් මෙම විහාරය සංවර්ධනය වී ඇත. විහාරය පිළිබඳ ලිඛිත මූලාශ්‍රය ලෙස කරඬු සටහනකින් හමු වේ. විහාරයේ උපෝසථාගාරය දෙමහල් මන්දිරයක් වන අතර එහි ප්‍රචලිත ප්‍රතිමා තුනකි. පරණවිතාන මෙහි තෙමහල් මන්දිරයක් තිබූ බව සඳහන් කර තිබේ. එය මහනුවර යුගයේ වාස්තුවිද්‍යාවේ අපූරු නිර්මාණයකි. විහාරගෙට ප්‍රවේශවන දොරටුවේ ශිලාමය උළුවස්ස අලංකාර කැටයමින් සමන්විතය. උළුවස්සේ පසෙක නාගරි අක්ෂරයෙන් රචිත ලේඛනයක් කොටා ඇති අතර එය පැහැදිලි නොමැත. විහාරයේ සිතුවම් ලෙස රජ රූපයක්, බෝසත් රූපයක්, අජපල් නුගරුක මුල වැඩ සිටීම, නාගදරණය වැනි සිතුවම් ද කැටයම් ලෙස හේරුණ්ඩ පක්ෂි රූපය කේන්ද්‍ර කරගත් ලියවැල්, පලාපෙති මෝස්තර, සැරපෙන්දියා යන කැටයම් ද දැකිය හැකිය. ප්‍රතිමා නිර්මාණයේදී පිරිපුන් හිසින් පුළුල් නළල් තලයෙන් වැඩුණු නාශිකාවෙන් යුත් උසස් ප්‍රතිමා නිර්මාණ දැකිය හැකිය. ශ්‍යාම දේශික උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා වැඩම වූ දෝලාව හෙවත් පල්ලැක්කිය තවමත් ආරක්ෂා වී පවතී. කීර්ති ශ්‍රී රාජසිංහ රජු හිඳ ගැනීමට භික්ෂූන්ට පූජාකළ කුලිච්චම හෙවත් ගුදිරිය අදටත් ඇති අතර පුස්කොළ ලියූ විද්‍යාස්ථානයක් තහවුරු වන අවස්ථාවක් ලෙස දණ්ඩාසනයක් දැකිය හැකිය. විහාරයේ මානවකෘති අතර හාල් සේරු පනහක බත් දැමිය හැකි මැටි පාත්‍රයක් දැකිය හැකි අතර පස්ලෝවලින් වාත්තු කළ ඉපැරණි කුඩා කරඬුවක් තිබේ. විහාරයේ පැරණි ප්‍රතිමා ප්‍රතිසංස්කරණය වෙනුවට කඩා ඉවත් කිරීම ද විහාරයට නව අංග එකතු කිරීම ද නිසා පැරණි සිතුවම් රාශියක් විනාශයට පත්ව ඇති අතර එය සංරක්ෂණය කිරීමේදී නිසි ක්‍රමවේදයකට සිදු නොකිරීම නිසා ඓතිහාසික වටිනාකමට හානි සිදු වී ඇත. මෙවැනි පෞරාණික වටිනාකමකින් යුත් ස්ථාන ප්‍රතිසංස්කරණයේදී සහ සංරක්ෂණයේදී පුරාවිද්‍යාඥයින්ගේ මැදිහත් වීම මත ක්‍රියා කිරීමට අවධානය යොමු කළ යුතු බව අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : දියසුන්නත කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාරය, සිතුවම්, පුරාවස්තු, මානවකෘති

[1 2 3] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය sachinidilushika99@gmail.com